එකී උකස් බැඳුම්කරයන් යටතේ (ප්‍රතිව්‍යුහගත ණය අංක 2893608 හේතුවෙන්) වෙනත් කරුණු අතර, රුපියල් මිලියන හතළිස් හතයි හය ලක්ෂ විසි එක් දහස් නවසිය හැටක (රු. 47,621,960.00)ක මුදලක් 2023 මැයි මස 04 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හතළිස් හතයි හය ලක්ෂ විසි එක් දහස් නවසිය හැටක (රු. 47,621,960.00) මුදල අයකර ගැනීම සඳහා සහ 2023 මැයි මස 05 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 47,621,960.00ක එකී මුදල මත වර්ෂයකට 10.00% බැගින් වැඩිදුර පොළිය ද සහිතව ප්‍රවාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 6914, 2711, 1374, 297, 1385, 1815, 2709, 3049 සහ 295 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයන්හි සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම හා පරිශ්‍රය මහරගම, කටුවාවල පාරේ, අංක 30/83 දරන ස්ථානයේ සහ එසේම කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ "ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන, බලයලත් වෙන්දේසිකරුවන් වන, ලොකු බණ්ඩා සේනානායක, මගුරු දෙනියේ වලව්වේ ත්‍රිවංක වරිත් සේනානායක සහ ගුරුගේ සුමනාවතී සේනානායක යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත (උපකාර්යාලය කෙසෙල්වත්ත), පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත 672B- දිග්ගල ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කෙසෙල්වත්ත පිහිටි "කිරිපැල්ලගහවත්ත, සියඹලාගහවත්ත, කැටකැලගහවත්ත *හෙවත්* කහටගහවත්ත සහ කිරිපැල්ලගහවත්ත පාවුල කුඹුර" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. අබේසිංහ විසින් 2003 සැප්තැම්බර් මස 19 දින පිළියෙල කරන ලද අංක 909 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කරන ලද ලොට් 2AB වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් : උතුරට : කේ. කේ. මරියා ෆොන්සේකා වර්තමානයේ එම්. ඩී. කුරේගේ දේපළ සහ අංක 6275 දරන පිඹුරේ එම ඉඩමේ ලොට් A, පාර සහ කැටකැලගහවත්ත *හෙවත්* කහටගහවත්ත මගින් ද; නැගෙනහිරට : පාර, කැටකැලගහවත්ත *හෙවත්* කහටගහවත්ත සහ පාර මගින් ද; දකුණට : පාර, දෙපා ඇළ, බලයලත් මිනින්දෝරු එස්. බී. අබේසිංහ විසින් පිළියෙළ කරන ලද අංක 759 දරන පිඹුරේ ලොට් 1 සහ මන්දාදිගේ ලක්ෂ්මන් ප්‍රනාන්දු වර්තමානයේ එම්. පී. අයි. කුරේගේ දේපළ මගින් ද සහ බස්නාහිරට : බලයලත් මිනින්දෝරු එස්. බී. අබේසිංහ විසින් පිළියෙල කරන ලද අංක 759 දරන පිඹුරේ ලොට් 1 සහ මන්දාදිගේ ලක්ෂ්මන් ප්‍රනාන්දු වර්තමානයේ එම්. පී. අයි. කුරේගේ දේපළ සහ පාර මගින් ද මායිම් වූ එකී අංක 909 දරන පිඹුර ප්‍රකාරව අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් දහ අටයි දශම දෙකයි බිංදුව (අ.01, රූ.02, පර්. 18.20)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/ පත්ඉරුව F 610/182 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු බී. එම්. එෆ්. කල්දේරා විසින් 1916.11.21 දින පිළියෙළ කරන ලද අංක 7754 දරන පිඹුරේ විස්තර කරන ලද පාර සහ අංක 909 දරන පිඹුරේ දැක්වෙන පාර වෙන්කිරීම් තුළ මතින් මාර්ග අයිතිය සමග වේ.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, කෙසෙල්වත්ත, දිග්ගල පිහිටි "කිරිපැල්ලගහවත්ත, සියඹලාගහවත්ත සහ කහටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ආර්. බී. සිල්වා විසින් 1957.03.12 දින පිළියෙල කරන ලද අංක 59 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කරන ලද යාබද ඉඩම් කොටස් තුනට මායිම් වශයෙන්; උතුරට : කෙසෙල්වත්ත සිට දිග්ගල තොටුපල දක්වා කරත්ත පාර මගින් ද; නැගෙනහිරට : තෙල්ගේ ඔවෙන් පීරිස්ට අයිතිවන ඉඩමක් මගින් ද; දකුණට : එම ඉඩමේ කොටසක් මගින් ද සහ බස්නාහිරට : අඩි 8 පළල පාර මගින් ද මායිම් වූ එකී අංක 59 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් විසි දෙකක (රූ.1, පර්. 22) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/ පත්ඉරුව F 56/140 යටතේ ලියාපදිංචි කර ඇත.

අංක 59 දරන පිඹුරේ දැක්වෙන එකී ඉඩම අංක 3136 දරන වඩා මෑත පිඹුරකට අනුව පහත පරිදි විස්තර වේ.

ඉහත කී කෙසෙල්වත්ත, දිග්ගල පිහිටි කෙසෙල්වත්ත, දිග්ගල තොටුපොල පාරේ, වරිපනම් අංක 1, 228 දරන "කිරිපැල්ලගහවත්ත, සියඹලාගහවත්ත සහ කහටගහවත්ත"

නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් 1990.05.16 දින පිළියෙල කරන ලද අංක 3136 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කරන ලද යාබද ඉඩම් කොටස් තුනට මායිම් වශයෙන්, උතුරට : දිග්ගල පාර මගින් ද; නැගෙනහිරට : තෙල්ගේ ඔවෙන් පීරිස්ගේ එම ඉඩමේ කොටසක් මගින් ද; දකුණට : එම ඉඩමේ කොටසක් මගින් ද සහ බස්නාහිරට : පාර මගින් ද මායිම් වූ එකී අංක 3136 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් විස්සක (රූ.1, පර්. 20) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

**තුන්වන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත (උප කාර්යාලය කෙසෙල්වත්ත) පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත 672B- දිග්ගල ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කෙසෙල්වත්ත පිහිටි "කහටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. බී. අබේසිංහ විසින් 2007 අප්‍රේල් 24 දින පිළියෙල කරන ලද අංක 1616 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කරන ලද ලොට් 4 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්; උතුරට : කලින් ඩබ්. නුවානිස් ප්‍රනාන්දුගේ, සංජීව ප්‍රන්නාදුගේ මිල්ලගහවත්ත මගින් ද; නැගෙනහිරට : අංක 913 දරන පිඹුරේ එම ඉඩමේ ලොට් B මගින් ද; දකුණට : දිග්ගල පාර මගින් ද සහ බස්නාහිරට : කලින් කේ. ජේම්ස් සිල්වාගේ, කාන්ත ද මෙල්ගේ එම ඉඩමේ ලොට් G සහ E මගින් ද මායිම් වූ එකී අංක 1616 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි තුනක (පර්. 23) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමඟ වේ.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2023 ජුනි මස 28 වැනි දින.

10-104

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - පානදුර ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.ක්‍යු 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 2893626
ස්ටීල් රෝච් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්

2023 ජූලි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. ඩී. සී. කේ. පෙරේරා විසින් 2017 ජුනි මස 14 වැනි දින සහතික කරන ලද අංක 198 සහ 2019 ජුනි මස 18 වැනි දින සහතික කරන ලද අංක 426 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දාවූ ද උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලියාපදිංචි කිරීමේ අංක PV 10678 දරන සමාගම් පනත යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක්වන පානදුර, කෙසෙල්වත්ත, දිග්ගල පාරේ, අංක 226 දරන ස්ථානයේ එහි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ස්ටීල් රෝච් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ පානදුර, කෙසෙල්වත්ත, දිග්ගල පාරේ, අංක 228 දරන ස්ථානයේ වික්‍රම සෝසගේ ජසින්තා බර්නදෙත් සිල්වා උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද (මෙහි පහත පළමුවන උපලේඛනයේ සහ/හෝ එකී උකස් බැඳුම්කරයන්ට අදාළ උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රය මත)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. පී. හේරත් විසින් 2005 දෙසැම්බර් මස 30 වැනි දින සහතික කරන ලද අංක 442 සහ පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. ඩී. සී. කේ. පෙරේරා විසින් 2017 ජුනි මස 14 වැනි දින සහතික කරන ලද අංක 199 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එකී ස්ටීල් රෝච් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ පානදුර, කෙසෙල්වත්ත, දිග්ගල පාරේ, අංක 228 දරන ස්ථානයේ මුතුතන්ත්‍රී පටබැඳිගේ ඩික්සන් කුරේ උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද (මෙහි පහත දෙවන උපලේඛනයේ සහ/හෝ එකී උකස් බැඳුම්කරයන්ට අදාළ උපලේඛනයේ සවිස්තරව විස්තරකර ඇති ඉඩම සහ පරිශ්‍රය මත);

ඉහත කී බැඳුම්කරයන් යටතේ (ප්‍රතිව්‍යුහගත කාලීන ණය අංක 2893626 හේතුවෙන් හිඟව තිබෙන මුල් මුදලේ කොටස) වෙනත් කරුණු අතර, රුපියල් මිලියන විසි හතයි එක් ලක්ෂ පනස් දහසක (රු. 27,150,000.00) මුදලක් 2023 මැයි 04 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන විසි හතයි එක් ලක්ෂ පනස් දහසක (රු. 27,150,000.00) මුදල අයකර ගැනීම සඳහා සහ 2023 මැයි මස 05 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 27,150,000.00 ක එකී මුදල මත වර්ෂයකට 10% බැගින් වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 198, 426, 442 සහ 199 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයන්හි සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම හා පරිශ්‍රය මහරගම, කටුවාවල පාරේ, අංක 30/83 දරන ස්ථානයේ සහ එසේම කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වන

මහලේ, අංක 200 දරන ස්ථානයේ "ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන, බලයලත් වෙන්දේසිකරු වන, ලොකු බණ්ඩා සේනානායක, මගුරු දෙනියේ වලව්වේ ත්‍රිවංක චරිත් සේනානායක සහ ගුරුගේ සුමනාවතී සේනානායක යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත (කෙසෙල්වත්ත උප කාර්යාලය) පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 672B - දිග්ගල ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කෙසෙල්වත්ත පිහිටි "කහටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එම්. ඩී. කුරේ විසින් 2003 නොවැම්බර් මස 15 වැනි දින පිළියෙල කරන ලද අංක 832 දරන පිඹුරෙන් බෙදාවෙන් කරන ලද ලොට් B1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මිල්ලගහවත්ත මගින් ද; නැගෙනහිරට : අනුර පරණවිතාන සහ අයිවෝ ප්‍රනාන්දු විසින් හිමිකම්ලත් ලොට් B හි කොටස් සහ එම ඉඩමේ කොටසක් මගින් ද; දකුණට : එම ඉඩමේ ලොට් B2 (වඩා නිවැරදිව එම ඉඩමේ කොටස) සහ දිග්ගල පාර මගින් ද සහ බස්නාහිරට : අංක 913 දරන පිඹුරේ ලොට් A මගින් ද මායිම් වූ එකී අංක 832 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් පහයි දශම පහක (රූ.1, පර්. 5.5) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමඟ වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍ඉරුව D 207/64 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 672B - දිග්ගල ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කෙසෙල්වත්ත, දිග්ගල පිහිටි "කිරිපැල්ලගහවත්ත, සියඹලාගහවත්ත සහ කහටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ආර්. බී. සිල්වා විසින් 1957.03.12 වැනි දින පිළියෙල කරන ලද අංක 59 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කරන ලද යාබද ඉඩම් කොටස් තුනට මායිම් වශයෙන්; උතුරට : කෙසෙල්වත්ත සිට දිග්ගල තොටුපල දක්වා කරත්ත පාර මගින් ද; නැගෙනහිරට : තෙල්ගේ ඔවෙන් පීරිස්ට අයිතිවන ඉඩමක් මගින් ද; දකුණට : එම ඉඩමේ කොටසක් මගින් ද සහ බස්නාහිරට : අඩි 8 පළල පාර මගින් ද මායිම් වූ එකී අංක 59 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් විසි දෙකක (රූ.1, පර්. 22) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ පස, ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමඟ වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍ඉරුව D 207/65 යටතේ ලියාපදිංචි කර ඇත.

අංක 59 දරන පිඹුරේ දැක්වෙන එකී ඉඩම අංක 3136 දරන වඩා මෑත පිඹුරකට අනුව පහත පරිදි විස්තර වේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 672B - දිග්ගල ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කෙසෙල්වත්ත, දිග්ගල පිහිටි කෙසෙල්වත්ත, දිග්ගල තොටුපොල පාරේ, වරිපනම් අංක 228 දරන "කිරිපැල්ලගහවත්ත, සියඹලාගහවත්ත සහ කහටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් 1990 මැයි මස 16 වැනි දින පිළියෙල කරන ලද අංක 3136 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කරන ලද යාබද ඉඩම් කොටස් තුනට මායිම් වශයෙන් ; උතුරට : දිග්ගල පාර මගින් ද; නැගෙනහිරට : තෙල්ගේ ඔවෙන් පීරිස්ගේ එම ඉඩමේ කොටස මගින් ද; දකුණට : එම ඉඩමේ කොටසක් මගින් ද සහ බස්නාහිරට : පාර මගින් ද මායිම් වූ එකී අංක 3136 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් විස්සක (රූ.1, පර්. 20) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ පස, ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

අංක 59 සහ 3136 දරන පිඹුරේ බස්නාහිර මායිම ලෙස දැක්වෙන පාර මතින් මාර්ග අයිතිය සමග වේ.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2023 ජූලි මස 28 වැනි දින.

10-101

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - පානදුර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව් 116) අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 2893689
කෙසෙල්වත්ත ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2023 ජූලි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. එල්. ජයවීර විසින් 2008 පෙබරවාරි මස 29 වැනි දින සහතික කරන ලද අංක 2710 සහ කළුතර ප්‍රසිද්ධ නොතාරිස් යූ. ඩී. පියසේන විසින් 2015 මාර්තු මස 17 වැනි දින සහතික කරන ලද අංක 4812 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සමාගම් පනත යටතේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන පානදුර, කෙසෙල්වත්ත, දිග්ගල පාරේ, අංක 226 දරන ස්ථානයේ එහි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති කෙසෙල්වත්ත ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ පානදුර, කෙසෙල්වත්ත, දිග්ගල පාරේ, අංක 228 දරන ස්ථානයේ වික්‍රමසෝසගේ ජසින්තා බර්නදෙත් ද සිල්වා *නොහොත්* වික්‍රමසෝසලාගේ ජසින්තා බර්නදෙත් ද සිල්වා උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද (මෙහි පහත පළමුවන උපලේඛනයේ සහ/හෝ එකී උකස් බැඳුම්කරයන්ට අදාළ උපලේඛනයේ සවිස්තරව විස්තරකර ඇති ඉඩම සහ පරිශ්‍රය මත)

කළුතර ප්‍රසිද්ධ නොතාරිස් යූ. ඩී. පියසේන විසින් 2015 මාර්තු 17 වැනි දින සහතික කරන ලද අංක 4813 සහ පානදුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එල්. වීරසේකර විසින් 2020 දෙසැම්බර් මස 16 වැනි දින සහතික කරන ලද අංක 26360 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එකී කෙසෙල්වත්ත ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ පානදුර, කෙසෙල්වත්ත, දිග්ගල පාරේ, අංක 228 දරන ස්ථානයේ මුතුතන්ත්‍රී පටබැඳිගේ ඩික්සන් කුරේ උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද (මෙහි පහත දෙවන උපලේඛනයේ සහ/හෝ එකී උකස් බැඳුම්කරයන්ට අදාළ උපලේඛනයේ සවිස්තරව විස්තරකර ඇති ඉඩම සහ පරිශ්‍රය මත)

එකී උකස් බැඳුම්කරයන් යටතේ (ප්‍රතිව්‍යුහගත ණය අංක 2893689 හේතුවෙන් හිඟව තිබෙන මුල් මුදලේ කොටස) වෙනත් කරුණු අතර, රුපියල් මිලියන හතළිස් හයයි තුන් ලක්ෂ පනස් දහසක (රු. 46,350,000.00) මුදලක් 2023 මැයි මස 04 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හතළිස් හයයි තුන් ලක්ෂ පනස් දහසක (රු. 46,350,000.00) මුදල අයකර ගැනීම සඳහා සහ 2023 මැයි මස 05 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 46,350,000.00ක එකී මුදල මත වර්ෂයකට 10.00% බැගින් වැඩිදුර පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 2710, 4812, 4813 සහ 26360 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනයන්හි සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම හා පරිශ්‍රය මහරගම, කටුවාවල පාරේ, අංක 30/83 දරන ස්ථානයේ සහ එසේම කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ "ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්" යන නාමය, විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන, බලයලත් වෙන්දේසිකරුවන් වන, ලොකු බණ්ඩා සේනානායක, මගුරු දෙනියේ වලව්වේ ත්‍රිවංක චරිත් සේනානායක සහ ගුරුගේ සුමනාවතී සේනානායක යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, කෙසෙල්වත්ත පිහිටි "කහටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එම්. ඩී. කුරේ විසින් 2003 නොවැම්බර් මස 15 වැනි දින පිළියෙල කරන ලද අංක 832 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් B1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්; උතුරට: මිල්ලගහවත්ත මගින් ද; නැගෙනහිරට : අනුර පරණවිතාන සහ අයිවෝ ප්‍රනාන්දු විසින් හිමිකම්ලත් ලොට් B හි කොටස සහ එම ඉඩමේ ලොට් B2 මගින් ද; දකුණට : එම ඉඩමේ ලොට් B2 සහ දිග්ගල පාර මගින් ද සහ බස්නාහිරට : අංක 913 දරන පිඹුරේ ලොට් A මගින් ද මායිම් වූ එකී අංක 832 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් පහයි දශම පහක (රූ.1, පර්. 5.5) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමඟ වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව F 450/267 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 672B - දිග්ගල ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කෙසෙල්වත්ත, දිග්ගල පිහිටි "කිරිපැල්ලගහවත්ත, සියඹලාගහවත්ත සහ කහටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ආර්. බී. සිල්වා විසින් 1957.03.12 වැනි දින පිළියෙල කරන ලද අංක 59 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කරන ලද යාබද ඉඩම් කොටස් තුනට මායිම් වශයෙන්; උතුරට : කෙසෙල්වත්ත සිට දිග්ගල තොටුපල දක්වා කරත්ත පාර මගින් ද; නැගෙනහිරට : තෙල්ගේ ඔවෙන් පීරිස්ට අයිතිවන ඉඩමක් මගින් ද; දකුණට : එම ඉඩමේ කොටසක් මගින් ද සහ බස්නාහිරට : අඩි 8 පළල පාර මගින් ද මායිම් වූ එකී අංක 59 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් විසි දෙකක (රූ.1, පර්.22) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ පස, ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමඟ වන මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව D 207/65 යටතේ ලියාපදිංචි කර ඇත.

අංක 59 දරන පිඹුරේ දැක්වෙන එකී ඉඩම අංක 3136 දරන වඩා මෑත පිඹුරකට අනුව පහත පරිදි විස්තර වේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභා සීමා ඇතුළත පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 672B - දිග්ගල ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත කෙසෙල්වත්ත, දිග්ගල පිහිටි කෙසෙල්වත්ත, දිග්ගල තොටුපොල පාරේ, වරිපනම් අංක 228 දරන "කිරිපැල්ලගහවත්ත, සියඹලාගහවත්ත සහ කහටගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් 1990 මැයි මස 16 වැනි දින පිළියෙල කරන ලද අංක 3136 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කරන ලද යාබද ඉඩම් කොටස් තුනට මායිම් වශයෙන්; උතුරට : දිග්ගල පාර මගින් ද; නැගෙනහිරට : තෙල්ගේ ඔවෙන් පීරිස්ගේ එම ඉඩමේ කොටසක් මගින් ද; දකුණට : එම ඉඩමේ කොටසක් මගින් ද සහ බස්නාහිරට : පාර මගින් ද මායිම් වූ එකී අංක 3136 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් විස්සක (රූ.1, පර්. 20) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ පස, ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

අංක 59 සහ 3136 දරන පිඹුරේ බස්නාහිර මායිම ලෙස දැක්වෙන පාර මතින් මාර්ග අයිතිය සමඟවේ.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2023 ජූලි මස 28 වැනි දින.

10-102

---

**කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - කටුගස්තොට ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වගන්තිය යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංක : 2120978, 2161533 සහ 2166175
බොබී ඉන්ටස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2025 ජූලි මස 30 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් ලියා සහතික කරන ලද 2016.10.28 දිනැති අංක 1926 සහ අංක 2017.08.16 දිනැති 2156 දරන උකස් දරන කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමින් වූ බැඳුම්කරයන් යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිසි ලෙස සංස්ථාගත කරන ලද සමාගමක් වන එහි ලියාපදිංචි කාර්යාලය සහ/හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 12, 1 වන පටුමඟ, මාවිල්මඩ, මහනුවර යන ස්ථානයේ පිහිටා ඇති බොබී ඉන්ටස්ට්‍රීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් බන්ධනදායි වශයෙන් සහ සියලු දෙනාම අංක 12, 1 වන පටුමග, මාවිල්මඩ, මහනුවර යන ලිපිනයේ අබ්දුල් රසාක්, ෆාත්මා ෂෆ්නා රසාක් සහ හුසේන් බේ රසාක් යන අය උකස්කරුවන් වශයෙන් මෙහි උපලේඛනයේ වඩාත් විස්තර කර දේපළ (සහ/හෝ මෙතැන් සිට උකස් බැඳුම්කරවල උපලේඛනවල සඳහන් කර ඇති) බොබී ඉන්ටස්ට්‍රීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ අබ්දුල් රසාක්, ෆාත්මා ෂෆ්නා රසාක් සහ හුසේන් බේ රසාක් නැමැති අය විසින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්;

එකී බැඳුම්කරය යටතේ රුපියල් තුන්සිය තිස් හතර මිලියන දහනව දහස් දෙසිය අනූවයි ශත විසි එකක (රු. 334,019,290.21) මුදලක් 2025 ජූනි මස 17 වැනි දින වන විට කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් තුන්සිය තිස් හතර මිලියන දහනව දහස් දෙසිය අනූවයි ශත විසි එකක (රු. 334,019,290.21) මුදල සඳහා වූ ණය ගිණුම් අංක 2120978, 2161533 සහ 2166175 සම්බන්ධයෙන් එම බැඳුම්කර මත හා විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 1926 සහ 2156 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස්කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රයන් මහනුවර, මාවිල්මඩ, දුටුගැමුණු මාවතේ, අංක 369/1 හි බලයලත් වෙන්දේසිකාර "ජයසූරිය ඇන්ඩ් ජයසූරිය ඔක්ෂනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

(අ) ණය අංක 2120978 සම්බන්ධයෙන්, රු. 71,688,481.96 ක එකතුවක් (2025 ජූනි 17 වැනි දින දක්වා මුදල සහ පොළිය) සහ ඉතිරි මුදල වන රු. 30,000,000.00 සඳහා 2025 ජූනි 18 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වාර්ෂිකව 15%ක අනුපාතයකින් වූ වැඩිදුර පොළිය ද සමග;

(ආ) ණය අංක 2161533 සම්බන්ධයෙන්, රු. 152,864,735.27 ක මුළු මුදලක් (2025 ජූනි මස 17 වැනි දින දක්වා මුදල සහ පොළිය) සහ ඉතිරි මුදල රු. 70,000,000.00 සඳහා වාර්ෂිකව PLR + 3% අනුපාතයකින් (2025.06.17 වැනි දිනට වාර්ෂිකව 14.19%) 2025 ජූනි මස 18 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වැඩිදුර පොළියක්; සහ

(ඇ) ණය අංක 2166175 සම්බන්ධයෙන්, රු. 109,466,072.98 (2025 ජූනි මස 17 වැනි දින දක්වා ප්‍රාග්ධනය සහ පොළිය),

සහ ඉතිරි ප්‍රාග්ධන මුදල වන රු. 50,000,000.00 සඳහා වාර්ෂිකව PLR+3% අනුපාතයකින් (2025.06.17 වන විට වාර්ෂිකව 14.19%) 2025 ජූනි මස 18 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා අමතර පොළියක් සමඟ.

**පළමුවන උපලේඛනය**

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාව තුළ මහනුවර ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා සීමාවේ නිත්තවෙල ග්‍රාම නිලධාරි වසමේ නිත්තවෙල කොට්ඨාස අංක 9 හි පිහිටි "වෙදගුරුන්නෙහෙලා වත්ත *නොහොත්* ගාලේතැන්න" නැමැති ඉඩමට බලයලත් මානක සී. පාලමකුඹුර විසින් මැන සාදන ලද 2003.05.07 දිනැති අංක 4245 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : මාවිල්මඩ පාර, අංක 44/1 දරන දේපළ, නැගෙනහිරට : ලොට් 2 සහ මාවිල්මඩ 1 වන පටුමග; ගිණිකොණට : ලොට් 2; දකුණට : ලොට් 2 සහ 3; නිරිතට : මාවිල්මඩ පාර, අංක 42/1 දරන දේපළ; වයඹට : මාවිල්මඩ පාර, අංක 44/3 දරන දේපළ යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විසි එකයි දශම හතරයි හතක් (රූ.01, පර්. 21.47) විශාල ඉඩම සහ එහි පිහිටි වරිපනම් අංක 12 දරන දේපළ සහ වරිපනම් අංක 14 දරන කර්මාන්තශාලාව ඇතුළු අනිකුත් සෑම සියලු දේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ590/61 වෙළුම/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාව තුළ මහනුවර ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභා සීමාවේ නිත්තවෙල ග්‍රාම නිලධාරි වසමේ නිත්තවෙල කොට්ඨාස, අංක 9 හි පිහිටි "වෙදගුරුන්නෙහෙලා වත්ත *නොහොත්* ගාලේතැන්න" නැමැති ඉඩමට බලයලත් මානක සී. පාලමකුඹුර විසින් මැන සාදන ලද 2003.05.07 දිනැති අංක 4245 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට සහ වයඹට : ලොට් 1; නැගෙනහිරට : මාවිල්මඩ 1 වන පටුමග; දකුණට : ලොට් 3; බස්නාහිරට : ලොට් 1 යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විස්සයි දශම බිංදුවයි හතක් (පර්. 20.07) විශාල ඉඩම සහ එහි පිහිටි සෑම සියලුදේත් වේ. මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 590/60 වෙළුම/පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

2025 ජූලි මස 30 වැනි දින.

10-82

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

විෂ්ණු ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංක : 0120 1000 0767

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.06.25 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ඒ. කේ. ඩී. ප්‍රසංග විසින් ලියා සහතික කරන ලද 2015 අගෝස්තු මස 21 දාතම හා අංක 1731 දරන, ආර්. අලහේන්ද්‍ර විසින් ලියා සහතික කරන ලද 2017 ජූලි මස 31 දාතම හා අංක 4284 දරන සහ ජී. එන්. එම්. කෝදාගොඩ විසින් ලියා සහතික කරන ලද 2017 ජූලි මස 31 දාතම හා අංක 2492 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසුගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 97683 දරන ශ්‍රී ලංකා සමාගම් නීතින් යටතේ නිසිලෙස සංස්ථා ගතකොට ඇති සමාගමක් වන විෂ්ණු ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 1731, 4284 සහ 2492 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහ නව කෝටි පනස් එක් ලක්ෂ හතළිස් එක් දහස් හත්සිය හැට දෙකයි ශත හැත්තෑ නවයක (රු. 195,141,762.79) මුදලක්, 2025 අප්‍රේල් මස 06 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහ නව කෝටි පනස් එක් ලක්ෂ හතළිස් එක්දහස් හත්සිය හැට දෙකයි ශත හැත්තෑ නවයක (රු. 195,141,762.79) මුදල ද, 2025 අප්‍රේල් මස 07 දින සිට අංක 1731, 4284 සහ 2492 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පහළොස් කෝටි හැත්තෑ දෙලක්ෂ හත් දහස් තුන්සියක (රු. 157,207,300.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%) හා තවත් රුපියල් එක් කෝටි අනූ එක් ලක්ෂ හැත්තෑ දහසක (රු. 19,170,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහක් (12%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1731, 4284 සහ 2492 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී

ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. i. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ වැල්ලවත්ත උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වෝඩ් අංක 43, වැල්ලවත්ත හි ඇලෙක්සැන්ඩ්‍රා පාරේ පිහිටි වෙළුම 34 පත්ඉරුව 267 වෙළුම 100 පත්ඉරුව 226 (අවසාන) ලියාපදිංචි කොට ඇති ලියාපදිංචි පිඹුරු අංක 2, වැල්ලවත්ත ලොට් 15 F G සහ H හි ලොට් C හි උපබෙදුමක් වන අලෙක්සැන්ඩ්‍රා පාර, වරිපනම් අංක 1 (කොටස) "කුඩාවැල්ලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. බාලක්‍රිෂ්ණන් විසින් සාදන ලද 1983 මැයි මස 14 දාතම හා අංක 137 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1491 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: ඇලෙක්සැන්ඩ්‍රා පාර; නැගෙනහිරට : ඇලෙක්සැන්ඩ්‍රා පාර, වරිපනම් අංක 1A දරන පරිශ්‍රයන් ලොට් B4 සහ 15 F G හි ලොට් A සහ ගාලු පාර, අංක 44 දරන පරිශ්‍රයන්; දකුණට: ලොට් 1492 සහ බස්නාහිරට : පාර (ලොට් 15F G සහ H ලොට් F) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම තුනයි පහක් (පර්. 15.35) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 137 දරන පිඹුරට අනුව Wella 139/241, 242 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ii. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ වැල්ලවත්ත උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වෝඩ් අංක 43, වැල්ලවත්ත හි ඇලෙක්සැන්ඩ්‍රා පාරේ පිහිටි වෙළුම 34 පත්ඉරුව, 267 වෙළුම 100 පත්ඉරුව 226 (අවසාන) ලියාපදිංචි කොට ඇති ලියාපදිංචි පිඹුරු අංක 2, වැල්ලවත්ත ලොට් 15 F G සහ H හි ලොට් C හි උපබෙදුමක් වන ඇලෙක්සැන්ඩ්‍රා පාර, වරිපනම් අංක 1 (කොටස) "කුඩාවැල්ලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. බාලක්‍රිෂ්ණන් විසින් සාදන ලද 1983 මැයි මස 14 දාතම හා අංක 137 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1492 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: ලොට් 1491; නැගෙනහිරට : 15 F G හි ලොට් A සහ ගාලු පාර, වරිපනම් අංක 44 දරන පරිශ්‍රයන්; දකුණට: ලොට් 151 (ගාලු පාර, වරිපනම් අංක 48 දරන පරිශ්‍රයන්) සහ බස්නාහිරට: පාර (ලොට් 15F හි ලොට් F, G සහ H) සහ ලොට් 15 F G හි ලොට් E සහ H (ඇලෙක්සැන්ඩ්‍රා පාර අංක 3 දරන පරිශ්‍රයන්) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම නවයයි දෙකක් (පර්. 8.92) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 137 දරන පිඹුරට අනුව Wella 139/243, 244 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන ඊ. එම්. අන්තෝනිස් විසින් සාදන ලද 1936 ඔක්තෝබර් මස 06 දාතම හා අංක 3518 දරන පිඹුරේ නිරූපිත ලොට් F දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

බලයලත් මානක තැන කේ. කනගසිංගම් විසින් සාදන ලද 2015 දෙසැම්බර් මස 18 දාතම හා අංක 4541 දරන පිඹුරේ නිරූපිත ලොට් R සහ Q වශයෙන් නිරූපිත එකී ලොට් 1491 සහ 1492 නැවත මැන උපබෙදුම් කොට ඒකාබද්ධ කොට ඇති අතර මෙහි දෙවන උපලේඛනයේ මැනවින් විස්තර වේ.

i. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාවන් තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ වැල්ලවත්ත උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වෝඩ් අංක 43 වැල්ලවත්ත උතුර ඇලෙක්සැන්ඩ්‍රා සහ අනුමත පුද්ගලික පාරක් දිගේ පිහිටි ඇලෙක්සැන්ඩ්‍රා පාර, වරිපනම් අංක 1 දරන "කුඩාවැල්ලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. කනගසිංගම් විසින් සාදන ලද 2015 දෙසැම්බර් මස 18 දාතම හා අංක 4541 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් R වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙහි ලොට් Q මෙහි (අනුමත කරන ලද වීදිරේඛාව තුළ ඉඩම); නැගෙනහිරට : ඇලෙක්සැන්ඩ්‍රා පාර, වරිපනම් අංක 1A දරන ලොට් B4 සහ ගාලු පාර, වරිපනම් අංක 44 දරන ලොට් 7575; දකුණට : ගාලු පාර, වරිපනම් අංක 46/2 දරන ලොට් 2564 සහ බස්නාහිරට : ඇලෙක්සැන්ඩ්‍රා පාර, වරිපනම් අංක 3 දරන ලොට් 6494 සහ ලොට් 15 F, G & H හි ලොට් F (මීටර් 3.5 (අඩි 10 පළල) අනුමත පුද්ගලික පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම එකයි බිංදුවක් (පර්. 22.10) හෝ හෙක්ටයාර බිංදුවයි දශම බිංදුවයි පහයි පහයි අටයි නවයයි හතක් (0.055897) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4541 දරන පිඹුරට අනුව SPE 112/62 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ii. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාවන් තුළ සහ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ වැල්ලවත්ත උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වෝඩ් අංක 43 වැල්ලවත්ත උතුර ඇලෙක්සැන්ඩ්‍රා සහ අනුමත පුද්ගලික පාරක් දිගේ පිහිටි ඇලෙක්සැන්ඩ්‍රා පාර, වරිපනම් අංක 1 "කුඩාවැල්ලවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. කනගසිංගම් විසින් සාදන ලද 2015 දෙසැම්බර් මස 18 දාතම හා අංක 4541 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් Q මෙහි (අනුමත කරන ලද වීදිරේඛාව තුළ ඉඩම) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ඇලෙක්සැන්ඩ්‍රා පාර; නැගෙනහිරට : ඇලෙක්සැන්ඩ්‍රා පාර, වරිපනම් අංක 1A දරන ලොට් B4; දකුණට : මෙහි ලොට් R සහ බස්නාහිරට : ලොට් 15 F, G & H හි ලොට් F (මීටර් 3.5 (අඩි 10 පළල) අනුමත පුද්ගලික පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම අටක් (පර්. 01.8) හෝ හෙක්ටයාර 0.004553ක් විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4541 දරන පිඹුරට අනුව SPE 112/64 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන ඊ. එම්. අන්තෝනිස් විසින් සාදන ලද 1936 ඔක්තෝබර් මස 06 දාතම හා අංක 3518 දරන පිඹුරේ නිරූපිත ලොට් F දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

(උකස් බැඳුම්කර අංක 1731 සහ 4284 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස පරිපාලන සීමාවන් තුළ දෙහිවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ දෙහිවල නැගෙනහිර අංක 540A ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වෝඩ් අංක 08, දෙහිවල බටහිර මුහන්දිරම් පටුමග දිගේ පිහිටි මුහන්දිරම් පටුමග, වරිපනම් අංක 20 "අලුත්වත්ත සහ ඇපොතිකරයවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. කනගසිංගම් විසින් සාදන ලද 2016 පෙබරවාරි මස 06 දාතම හා අංක 4592 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් M වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : පීටර්ස් පටුමග සහ පීටර්ස් පටුමග, වරිපනම් අංක 9 දරන ලොට් 2380; නැගෙනහිරට : පීටර්ස් පටුමග, වරිපනම් අංක 9 දරන ලොට් 2380 සහ මුහන්දිරම් පටුමග, වරිපනම් අංක 16 දරන ලොට් $8^{A1}$; දකුණට : මුහන්දිරම් පටුමග සහ බස්නාහිරට : පීටර්ස් පටුමග, වරිපනම් අංක 9B දරන ලොට් 7X යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම නවයයි දෙකක් (පර්. 12.92) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 4592 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිකාව Dehi 119/63 යටතේ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 2492 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

10-111

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

කේ. එම්. එල්. එන්ටර්ප්‍රයිසස්
ගිණුම් අංක : 0030 1000 2558

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.07.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් මීගමුව ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන කේ. ඒ. ඩී. සුබසිංහ විසින් ලියා සහතික කරන ලද 2012 මැයි මස 25 දාතම හා අංක 735 දරන, 2011 මැයි මස 12 දාතම හා අංක 547 දරන, 2023 අගෝස්තු මස 04 දාතම හා අංක 8622 දරන, 2008 දෙසැම්බර් මස 04 දාතම හා අංක 216 දරන උකස් බැඳුම්කර සියල්ල සහ එෆ්. ප්‍රනාන්දුපුල්ලේ විසින් ලියා සහතික කරන ලද 2013 නොවැම්බර් මස 08 දාතම හා අංක 18375 දරන උකස් බැඳුම්කරය යන බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "කේ. එම්. එල්. එන්ටර්ප්‍රයිසස්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන වර්ණකුලසූරිය ලූඩ්ගාර් ලියෝ කමල් තමෙල් බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 735, 547, 8622,

216 සහ 18735 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හය කෝටි අසූ හතර ලක්ෂ හැත්තෑ තුන් දහස් අටසිය විස්සයි ශත තිස් හයක (රු. 68,473,820.36) මුදලක් 2025 අප්‍රේල් මස 06 වැනි දිනට එකී අංක 735, 547, 8622, 216 සහ 18735 දරන උකස් බැඳුම්කර, එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හය කෝටි අසූ හතර ලක්ෂ හැත්තෑ තුන් දහස් අටසිය විස්සයි ශත තිස් හයක (රු. 68,473,820.36) මුදල ද, 2025 අප්‍රේල් මස 07 වැනි දින සිට එකී අංක 735, 547, 8622, 216 සහ 18735 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පන් කෝටි අසූ ලක්ෂ තිස් අට දහසක (රු. 58,038,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම හතරයි පහක් (15.45%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 735, 547, 8622, 216 සහ 18735 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

## උපලේඛනය

1. i. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්හල් පත්තුවේ, මැද කටුනේරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නාත්තන්දෙණිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පහළ කටුනේරිය පිහිටි "ඇහැටුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද 1997 අප්‍රේල් මස 02 දාතම හා අංක 5441 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: මෙහි ලොට් 02; නැගෙනහිරට : මෙහි ලොට් 03; දකුණට : පාර (ප්‍රාදේශීය සභා) සහ බස්නාහිරට : හලාවත සිට කොළඹ දක්වා ප්‍රධාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි පහක් (පර්. 25) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 5441 දරන පිඹුරට අනුව වෙළුම/ පත්‍රිරුව G 142/97 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

   ii. එකී පහළ කටුනේරිය පිහිටි "ඇහැටුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද 1997 අප්‍රේල් මස 02 දාතම හා අංක 5441 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 02 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : එන්. ඩබ්ලිව්. පී. ජෝයි සනත් ශ්‍රීමාල් ප්‍රනාන්දුගේ ඉඩම; නැගෙනහිරට : මෙහි ලොට් 03; දකුණට: මෙහි ලොට් 01 සහ බස්නාහිරට : හලාවත සිට කොළඹ දක්වා ප්‍රධාන පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි පහක් (පර්. 25) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සමග එකී අංක 5441 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 120/236 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. i. එකී පහළ කටුනේරිය පිහිටි "ඇහැටුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද 1997 අප්‍රේල් මස 02 දාතම හා අංක 5441 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 03 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : ජෝයි සනත් ශ්‍රීමාල්ගේ ඉඩම; නැගෙනහිරට: මෙහි ලොට් 4; දකුණට : පාර (ප්‍රාදේශීය සභා) සහ බස්නාහිරට : මෙහි ලොට් 1 සහ ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම පහක් (පර්. 15.5) හෝ හෙක්ටයාර 0.0392 විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සමග එකී අංක 5441 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 170/54 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

   ii. එකී පහළ කටුනේරිය පිහිටි "ඇහැටුගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද 1997 අප්‍රේල් මස 02 දාතම හා අංක 5441 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 04 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : ජෝයි සනත් ශ්‍රීමාල්ගේ ඉඩම; නැගෙනහිරට: එල්. ලාසරස් ප්‍රනාන්දුගේ ඉඩම; දකුණට : පාර (ප්‍රාදේශීය සභා) සහ බස්නාහිරට : මෙහි ලොට් 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (පර්. 15) හෝ හෙක්ටයාර 0.0379 විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියළු දේ සමග එකී අංක 5441 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 142/81 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

   (උකස් බැඳුම්කර අංක 735, 216 සහ 18375 මගින් හා ඒ යටතේ උකස්කොට ඇප කොට ඇත.)

3. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්හල් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පහළ කටුනේරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ

පහළ කටුනේරිය ග්‍රාමයේ පිහිටි "මාදංගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එස්. සුමිත් ඒ. ප්‍රනාන්දු විසින් සාදන ලද 2023 ජූලි මස 22 දාතම හා අංක 9424 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට : බලයලත් මානක තැන වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද අංක 1473A දරන පිඹුරේ නිරූපිත ලොට් 4; දකුණට : ඩබ්ලිව්. ඇන්ටනි ප්‍රනාන්දු විසින් හිමිකම් කියන ඉඩම සහ බස්නාහිරට : ඩබ්ලිව්. ඇන්ටනි ප්‍රනාන්දු විසින් හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විස්සක් (රූ. 1, පර්. 20.0) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 9424 දරන පිඹුරට අනුව ය.

එකී අංක 9424 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩම්වල ඒකාබද්ධයක් සහ නැවත මිනුමකි :

(*a*) වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්හල් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පහළ කටුනේරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පහළ කටුනේරිය ග්‍රාමයේ පිහිටි "මාදංගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද 2002 ජනවාරි මස 10 දාතම හා අංක 7887 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : කොළඹ හලාවත ප්‍රධාන පාර දක්වා දිවෙන පාර ගම් සභා පාර; නැගෙනහිරට : එකී පිඹුරේ ලොට් 2; දකුණට සහ බස්නාහිරට : ඩබ්ලිව්. ඇන්ටනි ප්‍රනාන්දුගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (පර්. 30) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 7887 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 121/136 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කොට ඇත.

(*b*) වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, කම්හල් පත්තුවේ, නාත්තන්ඩිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ පහළ කටුනේරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පහළ කටුනේරිය ග්‍රාමයේ පිහිටි "මාදංගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද 2002 ජනවාරි මස 10 දාතම හා අංක 7887 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : කොළඹ හලාවත ප්‍රධාන පාර දක්වා දිවෙන පාර ගම් සභා පාර; නැගෙනහිරට : බලයලත් මානක තැන වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද අංක 1473A දරන පිඹුරේ නිරූපිත ලොට් 4; දකුණට : ඩබ්ලිව්. ඇන්ටනි ප්‍රනාන්දු විසින් හිමිකම් කියන ඉඩම සහ බස්නාහිරට : ඩබ්ලිව්. ඇන්ටනි ප්‍රනාන්දු විසින් හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (පර්. 30) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 7887 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 121/137 යටතේ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 547 සහ 8622 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

10-112

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

සංජේ සචින් ටෙක්ස්ටයිල්ස්
ගිණුම් අංක : 0193 1000 6192

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.07.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සී. ජී. අබේවික්‍රම විසින් ලියා සහතික කරන ලද 2021 ජනවාරි මස 29 දාතම හා අංක 4176 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය පහසුකම් ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "සංජේ සචින් ටෙක්ස්ටයිස්" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරු වන පීටර් මේරි ජස්මින් බන්ධනදායි වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 4176 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැටපන් ලක්ෂ දාහත් දහස් දෙසිය විසි අටයි ශත හතරක (රු. 6,517,228.04) මුදලක් 2025

අප්‍රේල් මස 06 වැනි දිනට එකී අංක 4176 දරන උකස් බැඳුම්කරය, එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එය ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැට පන් ලක්ෂ දාහත් දහස් දෙසිය විසි අටයි ශත හතරක (රු. 6,517,228.04) මුදල ද, 2025 අප්‍රේල් මස 07 වැනි දින සිට එකී අංක 4176 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් හය ලක්ෂ අනූ තුන් දහස් හත්සිය විසි තුනයි ශත හතළිස් එකක (රු. 5,693,723.41) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම බිංදුවක් (12.0%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, එකී අංක 4176 දරන උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මිලාගිරිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මිලාගිරිය, වෝඩ් අංක 39, හේග් පාරේ පිහිටි හේග් පාර, වරිපනම් අංක 37 දරන "අප්පුහාමිගේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජේ. ඒ. ඩබ්ලිව්. කර්වාලෝ විසින් සාදන ලද 2020 සැප්තැම්බර් මස 03 දාතම හා අංක 8968 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් B2A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: හේග් පාර සහ පොදු පෙදෙස; නැගෙනහිරට : පොදු පෙදෙස සහ හේග් පාර, වරිපනම් අංක 33 දරන පරිශ්‍රයන්; දකුණට : බෙල්ටන පටුමග, වරිපනම් අංක 28 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : හේග් පාර, වරිපනම් අංක 39 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම හයයි පහක් (පර්. 1.65) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 8968 දරන පිඹුරට අනුව ය.

එකී අංක B2A බලයලත් මානක තැන බී. එස්. අලහකෝන් විසින් සාදන ලද 1996 මාර්තු මස 02 දාතම හා අංක 281 දරන පිඹුරේ නිරූපිත ලොට් B2 හි නැවත මිනුමක් වන අතර එය පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමක් ද වේ.

එකී මිලාගිරිය, වෝඩ් අංක 39, බම්බලපිටිය පිහිටි "අප්පුහාමිගේවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන බී. එස්. අලහකෝන් විසින් සාදන ලද 1996 මාර්තු මස 02 දාතම හා අංක 281 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් B2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : හේග් පාර සහ පොදු පෙදෙස; නැගෙනහිරට : පොදු පෙදෙස සහ හේග් පාර, වරිපනම් අංක 33 දරන පරිශ්‍රයන්; දකුණට : බෙල්ටන පටුමග, වරිපනම් අංක 28 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : ලොට් B1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම හයයි පහක් (පර්. 1.65) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 281 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව E 245/51 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

10-110

---

### මහජන බැංකුව - ආයතනික බැංකු අංශය

### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 (ඈ) වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයයි

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.09.09 දින පවත්වන ලද තම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 (ඈ) වගන්තිය යටතේ පහත සඳහන් වන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපනය කර ඇත්තා වූ ද ලියාපදිංචි අංක PV 17969 දරන සහ කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස් මාවත, අංක 257 දරන ස්ථානයේ තම ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තා වූ ද, සමාගමක් වන ඊ. අයි. ඈන්ඩ් එම් (පුද්ගලික) සමාගම, ප්‍රසිද්ධ නොතාරිස් අයි. ඩී. එච්. එල්. පෙරේරා විසින් ලියා සහතික කළ 2010.09.23 දිනැති අංක 1795 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් දේවිකා එස්. මහවත්ත විසින් ලියා සහතික කරන ලද 2014.08.12 දිනැති 177 සහ 2016.12.09 දිනැති 676 දරන ගිවිසුම් සහ 2016.12.09 දිනැති 672 දරන උකස් බැඳුම්කරය මත අයවීමට ඇති ගෙවීම් පැහැර හැර ඇති හෙයින් රුපියල් මිලියන දෙසිය තුනයි නව ලක්ෂ පනස් හතරදහස් පන්සිය අසූ නවයයි ශත පනස් හයක (රු. 203,954,589.56) මුදලක් එහි ඉදිරි පොළිය ද සමග එකී උකස් බැඳුම්කරය මත මහජන බැංකුව වෙත මේ වන විට අය වීමට හිඟව සහ ලැබිය යුතුව තිබේ.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත

මගින් ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ ඉහත කී මුදල 2018 මාර්තු මස 15 දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් මිලියන හැට දෙකක (රු. 62,000,000.00) මුදලක් වන වාර්ෂිකව 14% පොළිය සහ 2024.11.07 දින සිට රුපියල් මිලියන දහ අටයි තුන් ලක්ෂ තිස් දහසක (රු. 18,330,000.00) මුදලක් මත වාර්ෂිකව පොළිය 12.75% [AWPLR + 3.5 (අර්ධ වාර්ෂික සමාලෝචනයට යටත්ව)] පොළිය සහ 2024.11.07 දිනයට රුපියල් මිලියන විසි හතරයි එක්ලක්ෂ එකොළොස් දහස් හාරසිය හතයි ශත හැත්තෑ එකකක (රු. 24,111,407.71) මුදලක් මත වාර්ෂික පොළිය 12.6%ක [AWPLR + 3.5% (අර්ධ වාර්ෂික සමලෝචනයට යටත්ව)] පොළිය සහ/හෝ මහජන බැංකු පනතේ 29(ඕ) වගන්තිය යටතේ අයකරගත හැකි ගාස්තු සහ මුදල් ද සමග, ඉන් අනතුරුව යම් මුදලක් ඇත්නම් එය අඩු කොට අයකර ගැනීම සඳහා ප්‍රසිද්ධ නොතාරිස් අයි. ඩී. එච්. එල්. පෙරේරා විසින් ලියා සහතික කළ 2010.09.23 දිනැති අංක 1795 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් දේවිකා එස්. මහවත්ත විසින් ලියා සහතික කරන ලද 2014.08.12 දිනැති 177 සහ 2016.12.09 දිනැති 676 දරන ගිවිසුම් සහ 2016.12.09 දිනැති 672 දරන උකස් බැඳුම්කරය මගින් එකී බැංකුව වෙත උකස් කර ඇති සහ මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ 08, ෆෙයා ෆීල්ඩ් උද්‍යානය, අංක 6ඒ දරන ස්ථානයේ පදිංචි බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම මගින් විකිණීමට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අධිකාරි පත්තුවේ, කැලණිය නගර සභා සීමාව තුළ කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙදමුල්ල, අංක 261 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වෙදමුල්ල ග්‍රාමයේ, වෝඩ් අංක 4 තුළ පිහිටි තොටුවේකුඹුර සහ නාරංගහදෙණියකුඹුර යන ඉඩම්වලට බලයලත් මිනින්දෝරු එච්. බර්ටි බුද්ධිසේන විසින් සකස් කළ 2008.12.10 දිනැති අංක 1382/2008 දරන පිඹුරේ නිරූපිත ලොට් X වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ ඉඩම් කොටසට, ඊසානට : බලයලත් මිනින්දෝරු එල්. පී. ඒ. ශාන්ත පෙරේරා විසින් සකස් කළ 1995.01.25 දිනැති අංක 64A/ SLLRDC දරන පිඹුරේ ලොට් 2 (මාර්ගයට කළ වෙන්කිරීම - මීටර් 10ක් පළල); ගිණිකොණට ; ඉහත සඳහන් 64A/SLLRDC දරන පිඹුරේ ලොට් 2 (මාර්ගයට කළ වෙන්කිරීම - මීටර් 10ක් පළල) සහ බලයලත් මිනින්දෝරු ඩබ්. ආර්. එම්. ප්‍රනාන්දු විසින් සකස් කළ 2008.08.10 දිනැති අංක 891/2008 දරන පිඹුරෙහි ලොට් බී; නිරිතට : එඩ්නා සමාගම විසින් අයිතිය ප්‍රකාශ කරන ඉහත කී අංක 891/2008 දරන පිඹුරේ ලොට් 8 සහ බලයලත් මිනින්දෝරු සී. එස්. ඊ. විජේසූරිය විසින් සකස් කළ අංක 1735 දරන පිඹුරේ ලොට් 2C; වයඹට : ඉහත කී අංක 1735 දරන පිඹුරේ ලොට් 2C යන මායිම් තුළ පිහිටි එකී 1382/2008 දරන පිඹුරට අනුව අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දහතුනයි දශම නවයයි (අ.1, රූ.3, පර්. 13.9) හෙක්ටයාර 0.7434 ප්‍රමාණයකින් සමන්විත ඉඩම් කොටසෙහි බදු අයිතිය වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 90/45හි ලියාපදිංචි කර ඇත.

මෙහි මාර්ග අයිතිය පහත සඳහන් ඉඩම් කොටස් සමග වේ.

(අ) කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C584/05 හි ලියාපදිංචි කර ඇති අංක 64A/SLLRDC දරන පිඹුරේ නිරූපිත ලොට් 1 ලෙස බෙදා වෙන් කර විස්තර කර ඇති ඉඩම් කොටස;

(ආ) කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C584/06 හි ලියාපදිංචි කර ඇති අංක 64A/SLLRDC දරන පිඹුරේ නිරූපිත ලොට් 2 ලෙස බෙදා වෙන් කර විස්තර කර ඇති ඉඩම් කොටස;

(ඇ) අංක 64A/SLLRDC දරන පිඹුරේ නිරූපිත මාර්ගයට කළ වෙන් කිරීම.

### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කොළඹ නගර සභා සීමාව තුළ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මරදාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සිරි ධම්ම මාවතේ, වරිපනම් අංක 19/A සහ අංක 19 දරන කොටස්වලට බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් සකස් කරන ලද 1999.01.30 දිනැති අංක 1527 දරන පිඹුරේ නිරූපිත ලොට් A ලෙස ලකුණු කර බෙදා වෙන් කළ ඉඩම් කොටසට : උතුරට : අංක 1239 දරන පිඹුරේ ලොට් 1 සහ අංක 1238 දරන පිඹුරේ ලොට් 1, සිරිධම්ම මාවතේ, වරිපනම් අංක 29/2 දරන පරිශ්‍රය; නැගෙනහිරට : අංක 1238 දරන පිඹුරේ ලොට් 1 හා 3 (පාර අඩි 10 පළල), අංක 1239 දරන පිඹුරේ ලොට් අංක 1 සහ කැම්බල් ටෙරස් හි වරිපනම් අංක 17 දරන පරිශ්‍රය; දකුණට : කැම්බල් ටෙරස්හි වරිපනම් අංක 17 සහ 11 දරන පරිශ්‍ර; බටහිරට: කැම්බල් ටෙරස්හි වරිපනම් අංක 11 දරන පරිශ්‍රය සහ සිරිධම්ම මාවතේ, වරිපනම් අංක 29/2 දරන පරිශ්‍රය යන මායිම් තුළ පිහිටි එකී 1527 දරන පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම දෙකයි පහයි (පර්. 15.25) හෝ හෙක්ටයාර 0.03861 ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් හා ඒ මත පිහිටි ගොඩනැගිලි, වගාවන් සියලු දේ සමග වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 93/120 හි ලියාපදිංචි කර ඇත.

මෙය පහත ඉඩම් කොටසෙහි සඳහන් වන මාර්ග අයිතිය ද සමග වේ.

බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් සකස් කරන ලද 1997.03.07 දිනැති අංක 1238 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 ලෙස ලකුණු කර බෙදා වෙන් කළ ඉඩම් කොටස (මාර්ගය සඳහා වෙන් කිරීම) උතුරට : මෙහි ම ලොට් 1; නැගෙනහිරට : සිරිධම්ම මාවත සහ අංක 160 දරන පිඹුරේ ලොට් A1 එනම් සිරිධම්ම මාවතේ, වරිපනම් අංක 19/A; දකුණට : අංක 160 දරන පිඹුරේ ලොට් A1 එනම් සිරිධම්ම මාවතේ, වරිපනම් අංක 19/A; බටහිරට : මෙහි ලොට් 2 හා 1 යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1238

දරන පිඹුරේ පර්චස් තුනයි දශම අටයි පහක් එනම් හෙක්ටයාර බිංදුවයි දශම බින්දුවයි බින්දුවයි නවයයි හතක (හෙ. 0.0097) ඉඩම් කොටස වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D93/121 හි ලියාපදිංචි කර ඇත.

**තෙවන උපලේඛනය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බොඩ කෝරළයේ, තනිප්පේරු පත්තුවේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හබ්බුන්කඩුව, අංක 19D දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ එගොඩපොත, මාවනැල්ල ද, නගර සභා සීමාව තුළ කොළඹ - මහනුවර මාර්ගයේ පිහිටා ඇති කොබොරුලන්දහේන දැන් වත්ත යන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. එස්. පණ්ඩිතරත්න විසින් සකස් කරන ලද 1985.01.01 දිනැති අංක 3299 දරන පිඹුරේ නිරූපිත ඉඩම් කොටසට මායිම්; උතුරට : වැට සහ මාවතලන්දහේන; නැගෙනහිරට : වැට සහ ගලගෙදරවත්ත; දකුණට : තාප්පය සහ කොළඹ - මහනුවර පාර; බටහිරට : වැට සහ මාවතලන්දහේන යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 3299 දරන පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් විසි එකකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස හා ඒ මත පිහිටි ගොඩනැගිලි, වගාවන් සියලු දේ සමග වන අතර, මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H 93/138 හි ලියාපදිංචි කර ඇත.

**සිව්වන උපලේඛනය**

(1) මාවනැල්ල නගර සභා සීමාව තුළ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හබ්බුන්කඩුව, අංක 19D දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ හබ්බුන්කඩුව, කොළඹ - මහනුවර මාර්ගයේ පිහිටා ඇති ඔමාරුදණ්ඩාවේකුඹුර සහ මාවතලන්දෙවත්ත ලෙස ලකුණු කර බෙදා වෙන් කළ ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. බී. රණතුංග විසින් සකස් කරන ලද 1985.12.31 දිනැති අංක 2256 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කර බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම් : උතුරට හා නැගෙනහිරට : අංක 1855 දරන පිඹුරේ ලොට් අංක 7හි ඉතුරු කොටස; දකුණට: කොළඹ - මහනුවර ප්‍රධාන පාර; බටහිරට : එඩ්නා ලයිට් ඉන්ජිනියරින් ලිමිටඩ් ට අයත් කොබොරුලන්දෙහේන යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2256 දරන පිඹුරට අනුව පර්චස් විසිතුනක (ප. 23) ඉඩම් කොටස හා ඒ මත පිහිටි ගොඩනැගිලි, වගාවන් සියලු දේ සමග වන අතර, මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H 93/139 හි ලියාපදිංචි කර ඇත.

(2) මාවනැල්ල නගර සභා සීමාව තුළ මහනුවර පාරේ, හම්බුන්කඩුව ග්‍රාමයේ පිහිටා ඇති බලයලත් මිනින්දෝරු එම්. බී. රණතුංග විසින් සකසන ලද 1989.03.03 දිනැති අංක 2737 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලෙස ලකුණු කර බෙදා වෙන් කළ ඉඩමට මායිම් : උතුරට : අංක 1855 දරන පිඹුරේ ලොට් 7හි ඉතුරු කොටස; නැගෙනහිරට : අංක 1855 දරන පිඹුරේ ලොට් 8 ලෙස දැ්වෙන අඩි 10 පාර; දකුණට : කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගය; බටහිරට : අංක 2256 දරන පිඹුරේ නිරූපිත දැන් එඩ්නා ඉන්ජිනියරින් (පුද්.) සමාගමට අයිති ලොට් 1 යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2737 දරන පිඹුරට අනුව රූඩ් දෙකක (රූ.2) ඉඩම් කොටස හා ඒ මත පිහිටි ගොඩනැගිලි, වගාවන් සියලු දේ සමග වන අතර මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ H 93/140 හි ලියාපදිංචි කර ඇත.

යට කී අංක 1855 දරන පිඹුරේ ලකුණු කර ඇති ලොට් අංක 08න් පෙන්වන අඩි 10ක් පළල මාර්ගයට කරන ලද වෙන් කිරීම ද මීට ඇතුළත් ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අයකිරීම්),
මහජන බැංකුව.

අයකිරීම් දෙපාර්තමේන්තුව,
10 වන මහල,
ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල,
අංක 75, සර්. චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

2025 සැප්තැම්බර් මස 23 වැනි දින.

10-121

---

**සෙලාන් බැන්ක් පී.එල්.සී. - මිලේනියම් ශාඛාව**

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත.)

ගිණුම් අංක : 0860-00010004-001

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2025.09.30 දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත ලියාපදිංචි අංක PB 110 දරන සහ කොළඹ 04 තම ලියාපදිංචි කාර්යාලය සහිත යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන "ද ගෝල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් කම්පනි ලිමිටඩ්" "බැඳුම්කරු"

වශයෙන් සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත ලියාපදිංචි අංක PB 49 දරන සහ කොළඹ 4, තම ලියාපදිංචි කාර්යාලය සහිත සමාගමක්වන සෙලින්කෝ හොස්පිටල්ස් ලිමිටඩ් සමාගම උකස්කරු වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) හි නමින් ප්‍රසිද්ධ නොතාරිස් ටී. එච්. ඩී. එල්. එල්. ජයසේකර විසින් ලියා සහතික කළ 2008 දෙසැම්බර් මස 08 දිනැති අංක 1579 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර මත ස්ථිර අයිරා පහසුකම සම්බන්ධයෙන් 2024 දෙසැම්බර් මස 31 දිනට මුල් මුදල සහ පොළිය වශයෙන් රුපියල් පස් බිලියන තුන්සිය අනූපස් මිලියන නවසිය හැත්තෑ අටදහස් තුන්සිය හැත්තෑ තුනයි ශත පනස් හයක මුදලක් (රු. 5,395,978,373.56) මුදලක් ද, 2025 ජනවාරි මස 01 දින සිට වාර්ෂිකව සියයට විසිඅට (28%) බැගින් පොළිය ද සමග සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ එකී මුදල එකී පනතේ 13 වගන්තිය යටතේ ප්‍රචාරණය කිරීමේ පිරිවැය ද, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ගෙවීම් (වෙතොත්) අඩුකොට, අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර වන සහ අංක 1579 දරන එකී උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකිණීමට බලයලත් වෙන්දේසිකරුවන වන්දිමා ගමගේ වෙත බලය ලබා දෙන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

ඕනෑම මුදල් අයකර ගැනීමක් අංක SC/FR/191/2009 දරන නඩුවෙහි 2015 අගෝස්තු මස 04 වැනි දිනැති ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගයට අනුකූලවවනු ඇති බවට ද තවදුරටත් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවෙහි, ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා සීමා තුළ නාවල පිහිටි "පරන්ගියා කුඹුර" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඩබ්ලිව්. කාවල්හෝ විසින් සකස් කළ 2003.03.20 දිනැති අංක 3398 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : මූ.පි.කො. 8113 දරන පිඹුරෙහි ලොට් 1 කැබැල්ල සහ ලොට් 2 කැබැල්ල ද; නැගෙනහිරට : මූ.පි.කො. 5722 දරන පිඹුරෙහි ලොට් 1 කැබැල්ල ද; ස්වර්ණ පාර සහ කුඹුර ද; දකුණට : මූ.පි.කො. 7946 පිඹුරෙහි ලොට් 1 කැබැල්ල ද සහ බටහිරට : මූ.පි.කො. 8113 දරන පිඹුරෙහි ලොට් 1 කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි අංක 3398 දරන එකී පිඹුරට අනුව අක්කර තුනයි රූඩ් දෙකයි පර්චස් නවයක (අ.3, රූ.2, පර්. 09) හෝ හෙක්ටෙයාර 1.4391 ක ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස වන්නේ ය.

පහත සඳහන්වන ඉඩම මතින් මාර්ග අයිතිය ද සමග.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවෙහි, ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා සීමාව තුළ නාවල පිහිටි "පරංගියා කුඹුර" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. ඩබ්ලිව්. කාවල්හෝ විසින් සකස් කළ 2003.03.20 දිනැති අංක 3398 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 (පාර) කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : කිරිමණ්ඩල මාවත ද; නැගෙනහිරට : මූ.පි.කො. 5722 දරන පිඹුරේ ලොට් 1 කැබැල්ල ද; දකුණට : ලොට් 1 කැබැල්ල ද සහ බටහිරට : මූ.පි.කො. 8113 දරන පිඹුරෙහි ලොට් 1 කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි අංක 3398 දරන එකී පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් බින්දුවයි හතක (රූ.1, පර්. 07) හෝ හෙක්ටෙයාර 0.1189ක ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස වන්නේ ය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවෙහි, ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා සීමාව තුළ කිරිමණ්ඩල මාවත පිහිටි "පරංගියා කුඹුර" *හෙවත්* ස්වර්ණ පෙදෙස, වරිපනම් අංක 3/14 හි කොටසක් සහ පරංගියා කුඹුර නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එස්. අලහකෝන් විසින් සකස් කළ 2005.03.18 දිනැති අංක 4110 දරන පිඹුරේ නිරූපිත ලොට් A කැබැල්ල (මැනුම්පති වෙනුවෙන් මිනින්දෝරු අධිකාරි විසින් සකස් කළ 1981.11.19 දිනැති අංක 5722 දරන පිඹුරේ ලොට් 1 කැබැල්ල වශයෙන් ලකුණු කළ ඉඩමේ කොටසක් වන) වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම්: උතුරට : කිරිමණ්ඩල මාවත ද; නැගෙනහිරට : මෙම ඉඩමේම කොටසක් ද; දකුණට සහ දකුණු බටහිරට : මූ.පි.කො. 17198 පිඹුරෙහි ලොට් 27 කැබැල්ල ද සහ බටහිරට : මූ.පි.කො. 17198 පිඹුරෙහි ලොට් 27 කැබැල්ල සහ පරංගියා කුඹුරෙහි කොටසක් (ප්‍රවේශ මාර්ගයේ කොටසක්) ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිනවයයි දශම හයයි හතරක (පර්. 29.64) හෝ හෙක්ටෙයාර් 0.0749ක් ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරි - නීති.

10-113

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2025 අගෝස්තු මස 27 දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව**

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. බී. බී. රත්නායක විසින් ලියා සහතික කරන ලද 2024.03.06 දිනැති අංක 501 සහ 499 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, සිය ලියාපදිංචි කාර්යාලය කොළඹ පවත්වාගෙන යන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද PV67022 දරන ගීතාංජන් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (මෙහි මින්මතු "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2025 පෙබරවාරි මස 28 දිනට එකී ගීතාංජන් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙතින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 501 සහ 499 දරන උකස් බැඳුම්කරයන් මත රුපියල් එකසිය නව මිලියන හාර ලක්ෂ තිස් දහස් අටසිය හතයි ශත එකක (රු. 109,430,807.01) මුදලක් ද, 2025 මාර්තු මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හතළිස් දෙමිලියන තුන් ලක්ෂ අට දහස් පන්සිය දහයයි ශත හැට හයක (රු. 42,308,510.66) මුදල මත පවත්නා අනුපාතය අනුව සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWPR SPOT) ඉහළින් වර්ෂයකට සියයට හයයි දශම පහක් (6.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් හැට හතර මිලියන හාර ලක්ෂ අනූ තුන් දහස් තිස් හතරයි ශත අසූ අටක (රු. 64,493,034.88) මුදල මත වර්ෂයකට සියයට තිස් හයක් (36%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදලවන රුපියල් එකසිය නව මිලියන හාර ලක්ෂ තිස් දහස් අටසිය හතයි ශත එකක (රු. 109,430,807.01) මුදලක් ද, 2025 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හතළිස් දෙමිලියන තුන් ලක්ෂ අට දහස් පන්සිය දහයයි ශත හැට හයක (රු. 42,308,510.66) මුදල මත පවත්නා අනුපාතය අනුව සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතිකයට (AWRP SPOT) ඉහළින් වර්ෂයකට සියයට හයයි දශම පහක් (6.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, රුපියල් හැට හතර මිලියන හාර ලක්ෂ අනූ තුන් දහස් තිස් හතරයි ශත අසූ අටක (රු. 64,493,034.88) මුදල මත වර්ෂයකට සියයට තිස් හයක් (36%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිවී ඇති යම් කොටසක් අයකර ගැනීම සඳහා එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැය කර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අය කිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 501 දරන උකස් බැඳුම්කරය මගින් වර්ණකුලසූරිය කුෂාලි සිරි විජයානි ප්‍රනාන්දු විසින් සහ අංක 499 දරන උකස් බැඳුම්කරය මගින් ගීතාංජන් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් විසින් ද ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම සහ ගොඩනැගිල්ල බලයලත් වෙන්දේසිකරු තුසිත් කරුණාරත්න ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

**අංක 501 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ නගර සභා බලසීමාව තුළ 160 A තලාදූව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොට්ඨාස අංක 10 (Ward No. 10) තලාදූව, නිකොලස් මාකස් ප්‍රනාන්දු මාවතේ, වරිපනම් අංක 13/6 සහ කොට්ඨාස අංක 11 කුරණ - බෝලවලාන හි පිහිටි "කඩොල්කැලේ *හෙවත්* කඩොල්කැලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. පී. විමලසේන විසින් සාදන ලද 2020.08.08 දිනැති අංක 11697 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 1265 දරන පිඹුරේ ලොට් 46 ද; නැගෙනහිරට: අංක 1265 දරන පිඹුරේ ලොට් 60 ද; දකුණට: අඩි 20ක් පළල පාර (මහ නගර සභා) (අංක 1265 දරන පිඹුරේ ලොට් 71) ද සහ බස්නාහිරට : අංක 1265 දරන පිඹුරේ ලොට් 58 ද වශයෙන් මායිම් වූ එකී අංක 11697 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහයක් (පර්. 10) විශාල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ.

අංක 11697 පිඹුරේ ලොට් 1 දරන ඉහත කී ඉඩම පහත විස්තර කරන ඉඩමේ නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ නගර සභා බලසීමාව තුළ 160 A තලාදූව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොට්ඨාස අංක 10 තලාදූව

සහ කොට්ඨාස අංක 11 කුරණ - බෝල්වලාන ගම්වල පිහිටි "කඩොල්කැලේ *හෙවත්* කඩොල්කැලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද 1987.11.10 දිනැති අංක 1265 දරන පිඹුරේ දැක්වෙන ලොට් 59 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 46 ද; නැගෙනහිරට : ලොට් 60 ද; දකුණට : අඩි 20 ක් පළල පාර (වඩාත් නිවැරදි ලොට් 71 - අඩි 20ක් පළල පාර) ද සහ බස්නාහිරට : ලොට් 58 ද වශයෙන් මායිම් වූ එකී අංක 1265 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහයක් (පර්. 10ක්) හෝ හෙ. 0.0253ක් විශාල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

පහත විස්තර කරන ඉඩම් මතින්වන මාර්ග අයිතිය ද සමග වේ.

බිම් මතින් සහ ඔස්සේ උකස්කරුට ඔහුගේ/ ඇයගේ ආගන්තුකයන්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහනිර්මාණ ශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයින්ට, කුලී නිවැසියන්ට, අවසරලාභීන්ට සහ ආරාධිතයන්ට මින් මතු සෑම වේලාවකම ඔවුන්ගේ අභිප්‍රාය හා කැමැත්ත පරිදි කවර කාර්යයක් සඳහා වුව ද දිවා හෝ රාත්‍රී කාලයේ පා ගමනින් හෝ වෙනත් ඕනෑම ආකාරයකින් අශ්වයින්, ගවයින් හෝ වෙනත් සතුන් ඇතිව හෝ නොමැතිව ද, මෝටර් කාර්, ලොරි සහ වෙනත් සෑම ආකාරයකම වාහන මගින් බර පටවා හෝ නොපටවා, මෙහි විශේෂයෙන් විස්තර කළ මාර්ග තුළින්, මතින් හෝ ඔස්සේ සෑම කල්හිම යාම ඊමට සහ ප්‍රත්‍යාගමනය කිරීමට ද ඇතුළුවීමට හෝ පිටවීමට ද පූර්ණ හා බාධා විරහිත අයිතිවාසිකම, නිදහස හා අවසරය ද එම බිම මතින්, තුළින් සහ/හෝ ඔස්සේ සහ ඉහළින් විදුලි කේබල්, මුදුන් කම්බි, ජලාපවහන, ගෑස් සහ ජලනල එළීමේ හා වෙනත් කවර වූ හෝ ආකාරයක උවාරණ හා උපක්‍රම යෙදීමේ අයිතිය ද ඇතුළත් ව -

බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද 1987.11.10 දිනැති අංක 1265 දරන පිඹුරේ දැක්වෙන ලොට් 3, 23, 24, 4 සහ 71 මතින් වන මාර්ග අයිතිය සහ ඒවා සංවර්ධනය කිරීමට භාවිතා කිරීමට ඇති අයිතිය සහ එකී ඉඩමට ඇති සියලුම මාර්ග ප්‍රවේශයන් භාවිතා කිරීමට ඇති අයිතිය ද සමග වේ.

**අංක 499 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

**ඉඩම I**

(1) දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තංගල්ල නගර සභා බලසීමාව තුළ දංකැටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දංකැටිය ගමේ, හම්බන්තොට පාරේ පිහිටි වරිපනම් අංක 25/10 දරන "පලුගහවත්ත *හෙවත්* දොන්තුගේ වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සරත්චන්ද්‍ර අන්දරවීර විසින් සාදන ලද 2010 ජනවාරි මස 07 දිනැති අංක 2010/01 දරන පිඹුරේ දැක්වෙන ලොට් 4 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : ලුවිනිස් පදිංචිව සිටි ඉඩම ද; නැගෙනහිරට : සෙක්කුව තිබුණු කොරටුව නමැති ඉඩම ද; දකුණට : සෙක්කුව තිබුණු කොරටුව නමැති ඉඩම ද සහ බස්නාහිරට: එකී අංක 2010/01 දරන පිඹුරේ ලොට් 3 (අඩි 13ක් පළල පාරක් සඳහා වූ වෙන් කිරීම) ද වශයෙන් මායිම් වූ එකී අංක 2010/01 දරන පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම හයයි බිංදුවක් (පර්. 18.60) විශාල ඉඩම එහි පිහිටි ගහකොළ, වැවිලි සහ ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

**මාර්ග අයිතිය**

පහත විස්තර කරන ඉඩම් මතින්වන මාර්ග අයිතිය ද සමග වේ.

බිම් මතින් සහ ඔස්සේ උකස්කරුට ඔහුගේ/ ඇයගේ ආගන්තුකයන්ට, ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහනිර්මාණ ශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයින්ට, කුලී නිවැසියන්ට, අවසරලාභීන්ට සහ ආරාධිතයන්ට මින් මතු සෑම වේලාවකම ඔවුන්ගේ අභිප්‍රාය හා කැමැත්ත පරිදි කවර කාර්යයක් සඳහා වුව ද දිවා හෝ රාත්‍රී කාලයේ පා ගමනින් හෝ වෙනත් ඕනෑම ආකාරයකින් අශ්වයින්, ගවයින් හෝ වෙනත් සතුන් ඇතිව හෝ නොමැතිව ද, මෝටර් කාර්, ලොරි සහ වෙනත් සෑම ආකාරයකම වාහන මගින් බර පටවා හෝ නොපටවා, මෙහි විශේෂයෙන් විස්තර කළ මාර්ග තුළින්, මතින් හෝ ඔස්සේ සෑම කල්හිම යාම ඊමට සහ ප්‍රත්‍යාගමනය කිරීමට ද ඇතුළුවීමට හෝ පිටවීමට ද පූර්ණ හා බාධා විරහිත අයිතිවාසිකම, නිදහස හා අවසරය ද එම බිම මතින්, තුළින් සහ/හෝ ඔස්සේ සහ ඉහළින් විදුලි කේබල්, මුදුන් කම්බි, ජලාපවහන, ගෑස් සහ ජලනල එළීමේ හා වෙනත් කවර වූ හෝ ආකාරයක උවාරණ හා උපක්‍රම යෙදීමේ අයිතිය ද ඇතුළත් ව -

(1) දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තංගල්ල නගර සභා බලසීමාව තුළ දංකැටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දංකැටිය ගමේ, හම්බන්තොට පාරේ පිහිටි "පලුගහවත්ත *හෙවත්* දොන්තුගේ වත්ත ලොට් 1" (වඩාත් නිවැරදිව පලුගහවත්ත *හෙවත්* දොන්තුගේ වත්ත) නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු සරත්චන්ද්‍ර අන්දරවීර විසින් සාදන ලද 2010 ජනවාරි මස 07 දිනැති අංක 2010/01 දරන පිඹුරේ දැක්වෙන ලොට් 3 (අඩි 13ක් පළල) වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්: උතුරට: එකී අංක 2010/01 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 සහ ලුවිනිස් පදිංචිව සිටි ඉඩම ද; නැගෙනහිරට : ලුවිනිස්

පදිංචිව සිටි ඉඩම, එකී අංක 2010/01 දරන පිඹුරේ දැක්වෙන ලොට් 4 සහ සෙක්කුව තිබුණ කොරටුව ද; දකුණට: රාහුල විද්‍යාලය සිට ප්‍රධාන පාරට යන පාර සහ බලයලත් මිනින්දෝරු එස්. කේ. පියදාස විසින් සාදන ලද අංක 303A දරන පිඹුරේ දැක්වෙන ලොට් A (වඩාත් නිවැරදිව ලොට් 4 (පාර) ද සහ බස්නාහිරට : එකී අංක 2010/01 දරන පිඹුරේ ලොට් 2, බලයලත් මිනින්දෝරු එස්. කේ. පියදාස විසින් සාදන ලද අංක 303 (වඩාත් නිවැරදිව 303A) දරන පිඹුරේ දැක්වෙන ලොට් 2 සහ ලොට් 4 (පාර) ද වශයෙන් මායිම් වූ එකී අංක 2010/01 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහ හතයි දශම බිංදුවයි නවයක් (පර්. 17.09ක්) විශාල ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

(2) බලයලත් මිනින්දෝරු එස්. කේ. පියදාස විසින් සාදන ලද 1975.04.03 දිනැති අංක 303 දරන පිඹුරේ දැක්වෙන ලොට් 4 පාරක් සඳහා වූ වෙන් කිරීම මතින් සහ ඔස්සේ වන මාර්ග අයිතිය ද සමග වේ.

**ඉඩම II**

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තංගල්ල නගර සභා බලසීමාව තුළ දංකැටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දංකැටිය ගමේ, හම්බන්තොට පාරේ පිහිටි වරිපනම් අංක 37 දරන "දොන්ගෙවත්ත *හෙවත්* සෙක්කුව තිබුණ කොරටුව" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සරත්චන්ද්‍ර අන්දරවීර විසින් සාදන ලද 2010 ජනවාරි මස 07 දිනැති අංක 2010/02 දරන පිඹුරේ දැක්වෙන ලොට් A වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : එම ඉඩමේ කොටසක් ද; නැගෙනහිරට : ප්‍රධාන පාර ද; දකුණට : එම ඉඩමේ කොටසක් ද සහ බස්නාහිරට : පරණවත්ත සහ දොන් සේතුගේවත්ත ද වශයෙන් මායිම් වූ එකී අංක 2010/02 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම නවයයි බිංදුවක් (පර්. 8.90) විශාල ඉඩම එහි පිහිටි ගහකොළ, වැව්ලි සහ ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ. මෙය තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

10-148

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.